# කයින් සිල් රැක රන්වන් සිරුරක් ලැබූ නමුත් වචනයෙන් අසංවර වී ඌරු කටක් ලැබූ ප්‍රේතයා

## සූකරමුඛ ප්‍රේත වස්තුව ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, පෙතවත්ථුපාළි, උරග වර්ගය - පිටු 2 - 3)

නාරද තෙරණුවෝ එක්තරා ප්‍රේතයෙක් දුටුවා. ඔහුගේ මුළු ශරීරයම රන්වන් පාටයි. දස දිසාවේ ම බබළනවා. නමුත් කට ඌරෙකුගේ වගෙයි.

ස්වාමීන් වහන්සේ ඇසුවා එයට හේතුව.

ප්‍රේතයා කිව්වා "කයින් සංවර ව සිටිය නිසා පැහැපත් ලස්සන ශරීරයක් ලැබුනා. එනමුත් වචනයෙන් අසංවර ව සිටිය නිසා ඌරු කටක් ලැබුණා"